විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය**

NERDC

# ඉදිකිරීම් අධීක්ෂක තනතුරු සඳහා බඳවා ගැනීම
## (සේවා පැවරුම් පදනම මත)

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවතින දිවයිනේ ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනය වන ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, ජාතික අවශ්‍යතා මත පදනම්ව මූලිකව ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති, වාණිජ ව්‍යාපෘති සහ කර්මාන්ත සඳහා සේවා සැපයීම සිදුකරනු ලැබේ.

අප ආයතනය මගින් උපදේශන සේවා ලබාදෙනු ලබන, බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අයත් පහත සඳහන් බන්ධනාගාරයන්හි ගොඩනැගිලි ඉදිකිරීම හා ඒ ආශ්‍රිත ඉදිකිරීම් ව්‍යාපෘතීන්හි අධීක්ෂණ කටයුතු වෙනුවෙන් **ඉදිකිරීම් අධීක්ෂකවරුන් (Construction Supervisors) තිදෙනෙකු මාස 06 ක කාලයකට සේවා පැවරුම් පදනම මත** බඳවා ගැනීමට සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. (සේවා අවශ්‍යතාවය මත සේවා පැවරුම් කාලසීමාව දීර්ඝ විය හැකිය)

- **කළුතර බන්ධනාගාරය - දෙමහල් ගොඩනැගිලි දෙකක් ඉදිකිරීම**
- **බදුල්ල බන්ධනාගාරය - බැරැක්ක ගොඩනැගිල්ල ඉදිකිරීම**
- **මීගමුව බන්ධනාගාරය - බැරැක්ක ගොඩනැගිල්ල ඉදිකිරීම**

**අධ්‍යාපන සුදුසුකම්** :

- තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 මට්ටමට නොඅඩු ඩිප්ලෝමා සුදුසුකම් ලබා තිබීම
- අ.පො.ස (සා/පෙළ) විෂයයන් 06ක් සමත් වී තිබීම සහ අ.පො.ස (උ/පෙළ) විභාගය සඳහා පෙනී සිටීම.

**අමතර සුදුසුකම්** :

- නර්ඩ් වියදම් පිරිමැසුම්දායක තාක්ෂණය පිළිබඳ දැනුම හා පළපුරුද්ද.

**රාජකාරී සහ වගකීම්** :

- කොන්ත්‍රාත්කරු විසින් සිදුකරණු ලබන ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය.
- ගොඩනැගිලි සැලසුම් / ව්‍යුහ සැලසුම් වලට අනුව ඉදිකිරීම් උපදෙස් ලබා දීම.
- කොන්ත්‍රාත්කරු විසින් සිදුකල වැඩ ප්‍රමාණයන්ගේ මිණුම් ගැනීම.
- කොන්ත්‍රාත්කරුගේ බිල්පත් පරීක්ෂාකර ගෙවීම් සඳහා ව්‍යාපෘති ඉංජිනේරුවරයාට ලබා දීම.
- අප ආයතනය විසින් වරින් වර ඉල්ලුම්කරන තොරතුරු / වාර්තා ලබා දීම
- අප ආයතනයේ ව්‍යාපෘතිය භාර ඉංජිනේරු මහතා විසින් දෙනු ලබන උපදෙස් වලට අනුකූලව කටයුතු කිරීම.
- ව්‍යාපෘතිය සාර්ථකව සිදුකිරීම සඳහා අවශ්‍ය වෙනත් සියළු කාර්යයන්.

**වැටුප** :

- මසකට අවම වශයෙන් දින 22 පැමිණීමකට යටත්ව උපරිම මාසික ගෙවීම රු. 75,000/- ක් වේ.
- සෑම සතියේ දිනකම රාජකාරී කාලය පෙ.ව. 8.30 සිට ප.ව. 5.00 දක්වා වේ. ව්‍යාපෘතියේ සේවා අවශ්‍යතාවය අනුව අමතර වැඩ කිරීමට සිදුවනු ඇත.

**වයස් සීමාව** :

- අවුරුදු 18 - 45 අතර විය යුතුය.

**අයදුම්පත් යොමු කිරීම** :

ඉදිකිරීම් අධීක්ෂණ කටයුතු සිදුකල හැකි ව්‍යාපෘති ස්ථානය සඳහන් කර ඔබගේ විස්තරාත්මක ජීව දත්ත තොරතුරු, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ විස්තර (නම, ලිපිනයන්, දුරකථන අංක) ද සහිතව අදාළ සහතිකපත් වල පිටපත් සමගින් අධ්‍යක්ෂ (මානව සම්පත්), ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, කාර්මික ජනපදය, ඒකල, ජා ඇල යන ලිපිනයට **2026 පෙබරවාරි 06 දිනට පෙර** ලියාපදිංචි තැපෑලෙන් **යොමු කරන්න.** නැතහොත් ආයතනයට පැමිණ බාර දීමට කටයුතු කරන්න. **(අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ කොටසේ වම් කෙළවරේ සඳහන් කරන්න.)**

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
**2බී/17බී**, කාර්මික ජනපදය,
ඒකල , ජා ඇල.

**දු.අ. : 0112 236 284, 0112 236 384, 0112 236 307** වෙබ් පිටුව : www.nerdc.lk

2026.01.21